# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1704/3 - 2011 මැයි 02 වැනි සඳුදා - 2011.05.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වගන්තිය යටතේ මාතර මහ නගර සභාවේ නියෝජ්‍ය නගරාධිපති ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

නියෝජ්‍ය නගරාධිපති, නගරාධිපති ධුරයට පත්වීම හේතු කොට ගෙන මාතර මහ නගර සභාවේ නියෝජ්‍ය නගරාධිපති ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 65අ (1) වගන්තිය යටතේ, නියෝජ්‍ය නගරාධිපති වන දීගොඩ ගමගේ යසරත්න නම් වූ නියෝජ්‍ය නගරාධිපති අයත් වන්නා වූ එක්සත් ජනතා නිදහස් සන්ධානය නම්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට, දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත නියෝජ්‍ය නගරාධිපති වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු යයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත් වන්නාවූ ද, ඒ මාතර මහ නගර සභාවේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා චතුරසිරි ජයසිංහ කරුණාරත්න මහතා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

මාතර මහ නගර සභාවේ තේරීම්භාර නිලධාරි කන්දඋඩආරච්චිගේ සුනෙත් ලෝචන වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, චතුරසිරි ජයසිංහ කරුණාරත්න මහතා මාතර මහ නගර සභාවේ නියෝජ්‍ය නගරාධිපති වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

සී. ඒ. සුනෙත් ලෝචන,
තේරීම්භාර නිලධාරි,
මාතර මහ නගර සභාව.

2011 අප්‍රේල් මස 27 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
මාතර.

05 - 367

1A - G 14482 — 345 (2011/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.